# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1789/34 - 2012 දෙසැම්බර් මස 20 වැනි බ්‍රහස්පතින්දා - 2012.12.20

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ශ්‍රී ලංකා මහ බැංකුවේ නිවේදන

**විනිමය පාලන පනත යටතේ දැන්වීම (ලංකා ව්‍යවස්ථාදායක ප්‍රඥප්ති සංග්‍රහයේ 423 වන අධිකාරය)**

**විනිමය පාලන පනතේ 7 වන සහ 8 වන වගන්ති ප්‍රකාරව වූ අවසරය**

1. යම් තැනැත්තෙකු විසින් ඔහුගේ විද්‍යුත් මුදල් මාරු කිරීමේ කාඩ්පතක් භාවිතයෙන් ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික තැනැත්තෙකුට විදේශ ව්‍යවහාර මුදල්වලින් ගෙවීම් කිරීම සඳහා විනිමය පාලන පනතේ (ලංකා ව්‍යවස්ථාදායක ප්‍රඥප්ති සංග්‍රහයේ 423 වන අධිකාරය වූ) 7 වන සහ 8 වන වගන්තිවල කාර්ය සඳහා පහත දැක්වෙන නියමයන් හා කොන්දේසිවලට යටත්ව මෙයින් අවසර දෙනු ලැබේ.

2. ශ්‍රී ලංකාව තුළ නේවාසික තැනැත්තෙකු විසින් ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික තැනැත්තෙකුට විද්‍යුත් මුදල් මාරු කිරීමේ කාඩ්පතකින් (EFTC) මුදල් ගෙවීම පහත සඳහන් කාර්යයන් සඳහා පමණක් විය යුතු ය.

   (i) සංචාරක, නවාතැන්, වෛද්‍ය පහසුකම්, ජීවන හා අධ්‍යාපන වියදම් ඇතුළු පෞද්ගලික ස්වභාවයේ සේවා සඳහා කාඩ්පත් හිමියකු විසින් විදේශ රටවල දී මුදල් ගෙවීම ;

   (ii) පෞද්ගලික ප්‍රයෝජනය සඳහා විදේශ රටවල දී භාණ්ඩ මිල දී ගැනීම සඳහා මුදල් ගෙවීම ;

   (iii) 1969 අංක 01 දරන ආනයන හා අපනයන (පාලන) පනත යටතේ නිකුත් කරන ලද විධිවිධානයන්හි සඳහන් නියමයන්, කොන්දේසි හා සීමාවන්ට යටත්ව පෞද්ගලික ප්‍රයෝජනය සඳහා ශ්‍රී ලංකාවට භාණ්ඩ ආනයනය කිරීම සඳහා මුදල් ගෙවීම ;

   (iv) විදේශීය වෘත්තිමය ආයතනයකට හෝ අධ්‍යාපනික ආයතනයකට ගෙවිය යුතු පෞද්ගලික ස්වභාවයේ ලියාපදිංචිවීමේ ගාස්තු, අමතර ඉගැන්වීමේ ගාස්තු, විභාග ගාස්තු සහ වාර්ෂික දායක මුදල් ගෙවීම ;

   (v) පෞද්ගලික ස්වභාවයේ සංචාරක සහ සෞඛ්‍ය රක්ෂණ සඳහා පමණක් රක්ෂණ වාරික සම්බන්ධයෙන් මුදල් ගෙවීම ;

   (vi) ශ්‍රී ලංකාවේ සිටින අතරතුර පෞද්ගලික ස්වභාවයේ විදේශ සංචාර හා නවාතැන් පහසුකම් සම්බන්ධයෙන් මුදල් ගෙවීම.

3. කාඩ්පත් හිමියා වෙනත් රටකට සංක්‍රමණය වන්නේ නම් හෝ විදේශ සේවා නියුක්තියක් සඳහා ශ්‍රී ලංකාව හැර යන්නේ නම්, ශ්‍රී ලංකාවේ නේවාසික තැනැත්තෙකුට නිකුත් කර ඇති මුදල් මාරු කිරීමේ කාඩ්පතක්, කාඩ්පත නිකුත් කළ බැංකුවට භාර දිය යුතු ය.

1A - G 017050 — 355 (2012/12)

4\. (i) 2. ඡේදයේ විෂය පථයට අයත් නොවන යම් ගණුදෙනුවක් සඳහා ශ්‍රී ලංකාවේ නේවාසික තැනැත්තෙකු විසින් ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික තැනැත්තෙකුට විද්‍යුත් මුදල් මාරු කිරීමේ කාඩ්පතක් හරහා කරනු ලබන යම් ගෙවීමක් සඳහා, එම ගෙවීම නේවාසික විදේශ ව්‍යවහාර මුදල් (RFC) ගිණුමක, නේවාසික විජාතික විදේශ ව්‍යවහාර මුදල් (RNNFC) ගිණුමක හෝ බලපත්‍රලාභී වාණිජ බැංකුවක අක්වෙරළ ශාඛාවක ඇති ගිණුමක බැරට පවතින අරමුදල්වලින් ගෙවීම සඳහා අවසර දෙන ලද ගණුදෙනුවක් සම්බන්ධයෙන් නොවන්නේ නම්, එම ගෙවීම සඳහා විනිමය පාලකවරයාගෙන් පූර්ව ලිඛිත අවසරය අවශ්‍ය වන්නේ ය.

(ii) අනේවාසික විදේශ ව්‍යවහාර මුදල් (NRFC) ගිණුමකට නිකුත් කරන ලද විද්‍යුත් මුදල් මාරු කිරීමේ කාඩ්පතක් හරහා ඕනෑම ගණුදෙනුවක් සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික තැනැත්තෙකුට ගෙවීමක් නිදහසේ සිදු කළ හැක.

5\. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස, මෙම නිවේදනයේ කාර්ය සඳහා –

'**විද්‍යුත් මුදල් හුවමාරු කාඩ්පත (EFTC)**' යන්නෙන් බැර, හර හෝ වෙනත් යම් ආකාරයක වටිනාකමක් මාරු කිරීම සඳහා භාවිතා කරන්නාට හැකියාව ලබා දෙන කාඩ්පතක් හෝ උපකරණයක් අදහස් වන අතර, ඊට ණය කාඩ්පත් (ක්‍රෙඩිට් කාඩ්), හර කාඩ්පත් (ඩෙබිට් කාඩ්) සහ වටිනාකම තැන්පත් කළ කාඩ්පත් ද ඇතුළත් වේ.

'**පෞද්ගලික**' යන්නෙන් කාඩ්පත හිමියාගේ, ඔහුගේ කලත්‍රයාගේ, ළමයින්ගේ සහ දෙමව්පියන්ගේ ප්‍රයෝජනය සඳහා භාවිතා කිරීම අදහස් වන අතර, එමගින් කාඩ්පත යම් වාණිජ කාර්යයන් සඳහා පාවිච්චි කිරීම අදහස් නොවේ.

2005 සැප්තැම්බර් 19 වැනි දින අංක 1411/5 දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද දැන්වීම මෙයින් අවලංගු කරනු ලැබේ.

පී. එච්. ඕ. චන්ද්‍රවංශ,
විනිමය පාලක.

2012 ක් වූ දෙසැම්බර් මස 20 වැනි දින,
කොළඹ දී ය.

01 - 152/1

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.